# පුරප්පාඩු

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC)

## ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් කාර්යශූර, ස්වයංගාමක, වෘත්තීය උන්නතිගාමී කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි අයවළුන්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමග අත්වැල් බැඳ ගැනීම අපි අපේක්ෂා කරමු.

**සියලුම අයදුම්කරුවන් :**

I. ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

II. තනතුරට අදාළ රාජකාරි නිසි අයුරින් ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකිවන අයුරින් මනා ශාරීරික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

III. මනා චරිතයකින් යුක්ත විය යුතුය.

### 01. රසායනඥ (Chemist) තනතුර (JM-1-1 ශ්‍රේණිය II)

**සුදුසුකම් - බාහිර අපේක්ෂකයින්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, රසායන විද්‍යාව හෝ ඖෂධ විද්‍යාව විෂයන් ලෙස අන්තර්ගත, විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්.

**(සැ.යු.) :** විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව පිළිබඳ පසුබිමක් සහිත වීම, අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

01. ඉහත සඳහන්, බාහිර අපේක්ෂකයන් හට, තිබිය යුතු අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

02. තනතුරට අදාළ වන, විෂය ක්ෂේත්‍රයක, "කළමනාකරණ සහකාර තාක්ෂණික". (MA 2-1) තනතුරක II වන ශ්‍රේණිය, අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

- **වැටුප් පරිමාණය :** JM 1-1-2016 : රුපියල් 42,600/- - 10x755 - 18x1,135 - 70,580/-

- **වයස් සීමාව :**

  අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

  මෙම උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවනු ඇත.

- **බඳවාගැනීමේ ක්‍රමවේදය :**

  ලිඛිත තරගකාරී පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**ආන්තික ප්‍රතිලාභ :**

- පැමිණීමේ හා කාර්යසාධන දිරිදීමනා
- ලබානොගත් වාර්ෂික හා අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම
- වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය හා වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණ යෝජනා ක්‍රමය.
- සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සංස්ථාව විසින් සේවකයාගේ වැටුපෙන් 15% ප්‍රමාණයකින් දායක වන අතර, සේවකයා විසින් තම වැටුපෙන් 10% ප්‍රමාණයකින් දායක විය යුතුය.
- එසේම සංස්ථාව විසින්, 3% කින් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) දායක වනු ඇත.
- 1983 අංක 12 දරන පාරිතෝෂිත පනත හා MSD චක්‍රලේඛය ප්‍රකාරව පාරිතෝෂිත මුදල් ගෙවනු ලැබේ.
- අනෙකුත් ආන්තික ප්‍රතිලාභද අයත් වේ.

**පොදු උපදෙස් :**

- නියමිත ආකෘති පත්‍රයෙහි සම්පූර්ණ කළ අයදුම්පත්, ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් විස්තර සමග ඉදිරිපත් කළ යුතුය. සියලු අධ්‍යාපනික සුදුසුකම්වල සහතික කළ පිටපත් අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතුය. අදාළ අයදුම්පත, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන http://www.spmclanka.lk වෙතින් බාගත කළ හැක.
- රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මගින් යොමුකළ යුතු අතර, ඔහු විසින්, මෙම අයදුම්කරු, ඉහත තනතුරට තෝරා ගතහොත් එම පත්වීම ලබාගැනීම සඳහා දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණු සඳහන් කළ යුතුය.
- අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත්, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් මෙම දැන්වීම පළවී දින 10 ක් ඇතුළත ලැබීමට සැලැස්විය යුතුය.
- ඉහත අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**සභාපති,**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC),**
**අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, කඳවල වත්ත, රත්මලාන.**